---

**හාරිස්පත්තුව ප්‍රාදේශිය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**

---

## 1. මුල්‍ය ප්‍රකාශන

### 1.1 මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම

සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මුල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 29 දින ද විගණනයට ඉදිරිපත් කර තිබු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 අගෝස්තු 07 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

### 1.2 මතය

මාගේ පරික්ෂණයෙන් පෙනි යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරිම් අනුව, හාරිස්පත්තුව ප්රාදේශිය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් ,මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මුල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට හාරිස්පත්තුව ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිලිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මුල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව මුල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වු මතය වේ.

### 1.3 මුල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්විම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

අය ශිර්ෂ 5 පොදු උපයෝගිතා සේවා සඳහා ගාස්තු යටතේ සමාලෝචිත වර්සයේ රු.1,821,000 ක

ආදායමක් ලැබි තිබු අතර එය අය ශිර්ෂ 04 ජලසේවා යටතේ ගිණුම්ගත කර තිබුණි.

## 2. මුල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මුල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවු ආදායම් රු.18,282,594 ක් වු අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවු ආදායම රු.7,368,355 ක් විය.

## 2.2. ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | 5,278 | 3,433 | 2,990 |
| (ii) බදු කුලී | 3,046 | 2,549 | 27 |
| (iii) බලපත්‍ර ගාස්තු | 2,080 | 1,460 | 251 |
| (iv) වෙනත් ආදායම් | 13,931 | 23,616 | 25,617 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 1,266,059 |
| (ii) මුද්දර ගාස්තු | 17,263,865 |

### 2.2.3 වෙනත් ආදායම්

(අ) ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ ලියාපදිංචි හෝටල් 02 කින් පිරිවැටුම මත සියයට 1 බැගින් බදු අය කර නොතිබිණි.

(ආ) JCB යන්ත්‍රය කුලී පදනම මත ලබා දීමෙන් 2012 වර්ෂය සඳහා රු.26,860 ක් අය කර නොතිබුණි.

## 2.3 නිශ්ක්‍රිය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

සමාලෝචිත වර්ෂය අවසානයට නිෂ්ක්‍රීයව හා ඌණ උපයෝජිතව පැවති වත්කම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විස්තරය | **අක්‍රීය කාලය** |
|---|---|
| යතුරු පැදිය (සි.ජී 125) | අවු. 05 ට වැඩි |
| අත්ටැක්ටරය (74-0578) | අවු. 05 ට වැඩි |
| මර්කස් අත්ටැක්ටරය | අවු. 05 ට වැඩි |
| ලොරල් අත්ටැක්ටරය (779291) | අවු. 05 ට වැඩි |

## 2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

ජල සම්බන්ධතාවය ලබා ගැනිම වැනි විවිධ කටයුතු සඳහා මාර්ග පළුදු කිරිමට 2012 වර්ෂයේදි අවස්ථා 242 කදි සභාව විසින් අවසර දි තිබුණ අතර එයින් අවස්ථා 240 කදි ඉල්ලුම්කරු විසින් ප්‍රතිසංස්කරණය කිරිමට එකග වි තිබුණි. එහෙත්, මෙම මාර්ග යලි තිබු තත්ත්වයට පත්කර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණු බව විගණනයේදි නිරික්ෂණය විය.

## 2.5 අවිධිමත් ගනුදෙනු

සභාව විසින් පවත්වනු ලබන නිවාස සැලසුම් කමිටු සඳහා සහභාගිවිම වෙනුවෙන් එක් කමිටු රැස්විම් වාරයක් සඳහා නිලධාරියකුට රුපියල් එක්දහස බැගින් දිමනාවක් ගෙවනු ලබන නමුත්, අවස්ථා 14 කදි රැස්විමට සහභාගි නොවු නිලධාරින් වෙත සමාලෝචිත වර්ෂයේදි රු.14,000 ක දීමනා ගෙවා තිබුණි.

## 2.6 අභ්‍යන්තර විගණනය

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

---

3. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) කොන්ත්‍රාත් පරිපාලනය